ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය(නාරා)

ලංසු අංකය-නාරා/පාලන/2021/116/RL/ටෙන්ඩර් අංක 46

# නාරා -කළුතර හරහා අළුත්ගම කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා කුලී වාහන ලබා ගැනීමට ලංසු කැඳවීම.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත,මට්ටක්කුලියකොළඹ-15
0112-521 000/0112-529 717
2021.05.06

# පටුන


**01.** පුවත්පත් දැන්වීම පිටු අංකය - 01-02

**02.** ලංසු කැඳවීමේ කොන්දේසි - 03-06

**03.** ලංසු ඉදිරිපත් කිරිමේ අයදුම්පත - 07-08



සභාපති

ප්‍රසම්පාදන මණ්ඩලය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

කාක දූපත,මට්ටක්කුලියකොළඹ-15

0112-521 000/0112-529 717


2021.04.06

**වෙබ් නිවේදනය**

යොමුව- නාරා/පාලන/2021/116/RL/ටෙන්ඩර් අංක46

**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

**ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත , මට්ටක්කුලිය ,කොළඹ-15**

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා)සිට කළුතර හරහා අළුත්ගම දක්වා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරිම සදහා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් මාසිකව ගෙවීමේ පදනම මත කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණ සදහා ආපසු නොගෙවන රු:500.00 ක මුදලක් සෘජුවම මහජන බැංකුව-මෝදර ශාඛාවේ ගිණුම් අංක 214-100-1536-29716 දරණ ගිණුමට බැර කර අදාළ රිසිට්පත ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛනය සමග දැක්වීමට හෝ නාරා ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත "අධ්‍යක්ෂක ජනරාල්",නාරා නමින් තැන්පත් කිරිමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙතින් ලබා ගත හැකිය.

01.අවශ්‍ය කෙරෙන වාහන පංතිය, ගමන් මාර්ගය හා අනෙකුත් පිරිවිතරයන් පහත දක්වා ඇත. කොන්ත්‍රාත් කාල සීමාව සංශෝධනය කිරිමේ පදනම මත 01 ක් වසරක කාල සීමාවක් සදහා ලංසු කැදවනු ලැබේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | වාහන පංතිය |
|---|---|---|---|---|---|---|
| | | නාරා සිට කළුතර බස් නැවතුම් පළ දක්වා | කළුතර බස් නැවතුම් පළ සිට අලුත්කම දක්වා | | | |
| නාරා-කළුතර හරහා අලුත්තම | උදෑසන- අලුත්ගම බස් නැවතුම ඉදිරිපිට සිට ගාලු පාර ඔස්සේ කොටුව දුම්රියපොළ ඉදිරිපිට මල්වත්ත පාරේ සිට අබ්දුල් කාදර් මාවත (රෙක්ලමේෂන් පාර)අලුත් මාවත පාර,විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ මට්ටක්කුලිය කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලය.<br>සවස- නාරා ප්‍රධාන කාර්යාලයේ සිට නාරා පාර,සී බීච් පාර,විස්ට්වයික් පාර,අලුත්මාවත පාර,කේ සිරිල් සී පෙරේරා මාවත,බ්ලූමැන්ඩල් පාර,ආමර් විදිය,පංචිකාවත්ත,මරදාන දුම්රිය පොළ, ටෙක්නිකල් හන්දිය,පිටකොටුව හරහා ගාලු පාර ඔස්සේ අලුත්ගම බස් නැවතුම දක්වා. | උදෑසන ගමන් වාරය- කි.මී 50.0<br>සවස ගමන් වාරය- කි.මී 52.7 | උදෑසන ගමන් වාරය- කි.මී 18.1<br>සවස ගමන් වාරය- කි.මී 18.1 | පෙ.ව 06.00 ට අලුත්ගම බස් නැවතුම ඉදිරිපිට සිට (මාර්ග තදබදය මත වේලාව සංශෝධනයට යටත් වේ)<br>කොටුව මල්වත්ත පාරට උදෑසන 08.05 වන විට පැමිණිය යුතුවේ. එම ස්ථානයෙන් පෙ.ව8.10 ට නාරා දක්වා ගමන් ආරම්භ කාල යුතුය. | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | ආසන 54 |

02.ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2021.09.15තෙක් විය යුතුය.

03. ලංසු ඉදිරිපත් කිරීමේදී ප්‍රවාහන සේවාව සඳහා ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් සමග පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

04.ලංසු ඉදිරිපත් කිරීමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරීම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අදාළ වන්නා වූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය නිකුත් කරනු ලබන්නේ 2021 මැයි 06සිට 2021 මැයි මස 12වන දින දක්වා පමණි.

07.මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2021 මැයි මස 13වන දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.

ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර ''නාරා-කළුතර හරහා අළුත්ගම දක්වා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවාව සඳහා මිළ ගණන් කැඳවීම-2021/ටෙන්ඩර් පෙට්ටි අංක- 01'' යනුවෙන් සඳහන් කළ යුතුය.

08.2021 මැයි මස 13 දින ප.ව 01.00 ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගි විය හැකිය.

09.මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්,ප්‍රසම්පාදන නිළධාරි මගින් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ15-
0112/529717 -0112-521000

දිනය-2021 මැයි මස 06

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය**

**මාසිකව ගෙවීමේ පදනම මත නාරා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සදහා කුලී වාහන ලබා ගැනීමට**

**ලංසු කැඳවීමේ කොන්දේසි**

යොමුව- නාරා/පාලන/2021/116/RL/ටෙන්ඩර් අංක46

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා)සිට කළුතර හරහා අලුත්ගම දක්වා කාර්ය මණ්ඩළය ප්‍රවාහනය කිරිම සඳහා ප්‍රසම්පාදන මණ්ඩළය විසින් මාසිකව ගෙවීමේ පදනම මත කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

ලංසු කැඳවීමේ කොන්දේසි මෙසේය. අදාල වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛනය මෙහි දක්වා ඇත .

**01 . අවශ්‍ය කරන වාහන පංතිය ගමන් මාර්ගය හා අවශ්‍ය අනෙකුත් පිරිවිතරයන් පහත පරිදි වේ.** කොන්ත්‍රාත් කාල සීමාව සංශෝධනය කිරිමේ පදනම මත 01 ක් වසරක කාල සීමාවක් සඳහා ලංසු කැඳවනු ලැබේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | වාහනයේ ආසන ගණන |
|---|---|---|---|---|---|---|
| | | නාරා සිට කළුතර බස් නැවතුම් පළ දක්වා | කළුතර බස් නැවතුම් පළ සිට අලුත්කම දක්වා | | | |
| නාරා-කළුතර හරහා අලුත්කම | උදෑසන-<br>අලුත්ගම බස් නැවතුම ඉදිරිපිට සිට ගාලු පාර ඔස්සේ කොටුව දුම්රියපොළ ඉදිරිපිට මල්වත්ත පාරේ සිට අබ්දුල් කාදර් මාවත (රෙක්ලමේෂන් පාර) අලුත් මාවත පාර , විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ මට්ටක්කුලිය කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලය.<br>සවස-<br>නාරා ප්‍රධාන කාර්යාලයේ සිට නාරා පාර,සී බීච් පාර,විස්ට්වයික් පාර , අලුත්මාවත පාර,කේ සිරිල් සී පෙරේරා මාවත ,බ්ලුමැන්ඩල් පාර,ආමර් විදිය,පංචිකාවත්ත,මරදාන දුම්රිය පොළ, ටෙක්නිකල් හන්දිය , පිටකොටුව හරහා ගාලු පාර ඔස්සේ අලුත්ගම බස් නැවතුම දක්වා. | උදෑසන ගමන් වාරය- කි.මී 50.0<br>සවස ගමන් වාරය- කි.මී 52.7 | උදෑසන ගමන් වාරය- කි.මී 18.1<br>සවස ගමන් වාරය- කි.මී 18.1 | පෙ.ව 06.00 ට අලුත්ගම බස් නැවතුම ඉදිරිපිට සිට (මාර්ග කදබදය මත වේලාව සංශෝධනයට යටත් වේ)<br>කොටුව මල්වත්ත පාරට උදෑසන 08.05 වන විට පැමිණිය යුතුවේ. එම ස්ථානයෙන් පෙ.ව8.10 ට නාරා දක්වා ගමන් ආරම්භ කල යුතුය. | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 54 |

**02. ලංසු ඉදිරිපත් කිරිම :-**

මෙයට අමුණා ඇති ලංසු ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කොට ඉදිරිපත් කල යුතු වේ. මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2021 මැයි මස 13 වන දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.

ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩකරන දින 90 ක් එනම්, 2021.09.15 තෙක් විය යුතුය.

ලංසු ඉදිරිපත් කිරිමේදී එක් ප්‍රවාහන සේවාවක් සඳහා ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් සමග පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය අවලංගු කල නොහැකි සහ නාරා ආයතනයෙන් කරනු ලබන පළමු ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කල හැකි විය යුතුය.සුරක්ෂණයේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට වැඩ කරන දින දින 119 ක් ,එනම් 2021.10.27.දින තෙක් විය යුතුය.

**03. ලංසු පිළිබඳ විස්තර:-**

මෙම ලංසු කැඳවීමේ කොන්දේසි කියවා තේරුම් කර ගත් ලංසුකරුවන් /ලංසුකරුවා විසින් මේ සමග ඇති ලංසු ආකෘතිය සම්පූර්ණ කොට. එමගින් ලංසුව ඉදිරිපත් කළ යුතුය,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ඇත.

**04. වාහන පරීක්ෂා කිරීම:-**

වාහන පරීක්ෂා කර බැලීම සඳහා දක්වා ඇති ලිපිනයෙහි පිහිටි නාරා ප්‍රධාන කාර්යාලයට දන්වන ලද දිනයේදී හා නියමිත වේලාවේදී වාහන ඉදිරිපත් කළ යුතුය.

**.05ග .ලංසු භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය:-**

අවම මිල සහිත ලංසුව පිළිගැනීමට ප්‍රසම්පාදක මණ්ඩලය බැඳී නැත. එසේම ඉදිරිපත් වී ඇති ලංසු සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම හෝ ඉන් කොටසක් භාර ගැනීම සඳහා බලය ප්‍රසම්පාදක මණ්ඩලයට ඇත. අනුමත වූ ලංසු හෝ ලංසුව පිළිබඳ අදාළ ලංසුකරුට ලියාපදිංචි තැපැලෙන් දැනුම් දෙනු ලැබේ.

**06. කාර්ය සාධන බැඳුම්කරය:-**

තෝරගත් ලංසුකරුට ඒ බව ලිඛිතව දැනුම් දීමෙන් දින 14 ක් ඇතුලත සේවා කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. මෙම බැඳුම්කරයේ වටිනාකම ලංසුකරුගේ වාර්ෂික සේවා ගාස්තුවෙන් 10 ලෙස ගණනය කරනු ලැබේ. මෙම බැඳුම්කරයේ වලංගු කාලය කොන්ත්‍රාත්තුව අවසන් අවසන් වීමෙන් පසු (මාස 12) දින 28 ක් දක්වා වියයුතු වේ. එය පිළිගත් වාණිජ බැංකුවක් නිකුත් කළ හෝ රක්ෂණ බැඳුම්කරයක් විය යුතු අතර නාරා ආයතනයේ පළමු ලිඛිත ඉල්ලීම මත ගෙවන බවට සහතිකයකින් සමන්විත විය යුතුය. නැතහොත් අදාල මුදල නාරා ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල් වෙත වලංගු මුදලින් තැන්පත් කර හෝ බැංකු අණකරයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

මෙම බැඳුම්කරය කොන්ත්‍රාත්තුව සාර්ථකව අවසන් කළ දිනයේ සිට දින 30 ක් ඇතුලත නිදහස් කරනු ලැබේ. කොන්ත්‍රාත්තුව බලපැවැත්වෙන කාලය තුලදී මෙම සේවාව සැපයීමේ යම් අඩුපාඩුවක් සිදු වුවහොත් කාර්යසාධන බැඳුම්කරය නිදහස් කරනු නොලැබේ.

තෝරගත් අයදුම්කරුවන් වෙත කෙරෙන ලිඛිත දැනුම් දීමෙන් පසු දින 21 ක් ඇතුලදී අනෙකුත් කොන්දේසි සම්පූර්ණ කරමින් අදාළ වාහනය නාරා ආයතනයේ සේවය සඳහා ලබා දිය යුතුවේ.

**07. ගෙවීමේ ක්‍රමය:-**

ගෙවීම් කරනුයේ අදාළ ලංසුකරු විසින් අත්සන් කර ඉදිරිපත් කරන බිල්පත් වලට පමණකි. එහිදී නාරා ආයතනයේ කාර්යමණ්ඩල සේවා භාර නිලධාරියාගේ සහතිකය ගෙවීම සඳහා අවශ්‍ය වේ. ඉල්ලුම් කරන සම්පූර්ණ මුදල. සේවා සපයන ලද දින ගණන. මාසිකව ගමන් ගත් දුර හා වාහනයේ අංකය එම බිල්පතේ පැහැදිලිව හා නිවරැදිව සඳහන් කළ යුතුය. ඩීසල් මිලේ ඉහළ පහළ යාම් අනුව පහත සඳහන් පරිදි ගෙවීම් සංශෝධනය කරනු ලැබේ.

සැ.යු- කොන්ත්‍රාත් කාල සීමාව තුල රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් වලට අනුකූලව සේවාව ලබා නොගන්නා දින වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමට නාරා ආයතනය විසින් කටයුතු කරනු නොලැබේ.

$$\frac{\text{ඩීසල් ලීටරයක මිල x මාසිකව සත්‍ය ලෙස ධාවනය කල කිලෝමීටර ගණන}}{\text{ඉන්ධන ලීටරයකින් ධාවනය කල හැකි කිලෝමීටර ගණන}}$$

**(අංක 01 හි සඳහන් කළ දුර ප්‍රමාණය මත පදනම්ව)**

මෙහිදී ඉන්ධන ලීටරයකින් ධාවනය කළ හැකි කිලෝමීටර් ගණන ගණනය කරනුයේ අදාළ වාහනය සම්බන්ධයෙන් නාරා ආයතනයේ බලයලත් නිලධාරි විසින් පරීක්ෂණ ධාවනයකින් පසුව නියම කරන අගය වේ. මාසයක් තුල ඩීසල් මිලේ වෙනස්වීම් කිහිපවතාවක් සිදුවුවහොත් වෙනස්වන කාල සීමාව අනුව ධාවනය කර ඇති දුර සලකා බලා. ඒ අනුව ගණනය කිරීම් සිදු කොට ගෙවීම් කරනු ලැබේ.

එක් මසක් තුල නියම කරනු ලබන ඕනෑම දිනයකදී / දිනයන්හි දී වාහනය සැපයීමට සැපයුම්කරු එකග විය යුතුය.

ධාවනය කරනු ලබන දුර ගණනය කරනු ලබන්නේ ගමනේ ආරම්භක ස්ථානය මෙහි අමුණා ඇති ලංසු ආරාධනා පත්‍රයේ 01 හි දක්වා ඇති ලෙසට හා අවසාන ස්ථානය නාරා ආයතනය ලෙස සලකමින් හා දක්වා ඇති මාර්ගයේ ගමන් ගනිමින් නාරා ආයතනයේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා කරන ධාවනයන් සඳහාය.

එකතු කිරීමේ අගය මත පනවන බද්ද (VAT) ගෙවනු ලබන්නේ එම බදු සඳහා ලියාපදිංචි අංකයක් ඇති හා ලංසු ආකෘතියේ ඒ බව සඳහන් කළ සැපයුම්කරුවන්ට පමණි.

**08. ගෙවීම් කරන ආකාරය:-**

සැපයුම්කරු විසින් ඉහත වගන්තියේ සඳහන් කළ පරිදි මාසික බිල්පත ඉදිරිපත් කළ යුතුය. ඉහත වගන්තියේ අවශ්‍යතා සම්පූර්ණ කරමින් යොමු කරන බිල් පත් සඳහා නාරා ආයතනය විසින් දින 21 ක් ඇතුළත ගෙවීම් සිදු කරනු ඇත.

**09. සැපයුම්කරුගේ සේවාවන් පමාවීම:-**

දක්වා ඇති වේලාවට අදාළ ස්ථානයෙන් උදෑසන ගමන් ආරම්භ කළ යුතු අතර පෙ.ව. 8.10 ට කොටුව, මල්වත්ත පාරෙන් නාරා ආයතනය දක්වා ගමන් ආරම්භ කළ යුතුය. 08.30 ට පෙර කාර්ය මණ්ඩලය ද සමඟ නාරා ප්‍රධාන කාර්යාලයට වාහනය පැමිණිය යුතු අතර. ප. ව: 04.20 ට කාර්ය මණ්ඩලය ද සමඟ නාරා ප්‍රධාන කාර්යාලයෙන් වාහනය පිටත් විය යුතුය. මෙම අවස්ථා දෙකේ සිදු වන ප්‍රමාද වීම් සඳහා පහත සඳහන් ආකාරයට ගෙවීම් ගාස්තුවෙන් අඩු කරනු ලැබේ.

01. එක් මසක් ඇතුළත සිදු කරන පළමු හා දෙවන ප්‍රමාද කිරීම් සඳහා අඩු කිරීම් නැත.
02. එක් මසක් ඇතුළත සිදු කරන තෙවන ප්‍රමාද කිරීමේ සිට.

| | | |
|---|---|---|
| i. | පළමු විනාඩි 15 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 10% |
| ii. | ඊළග විනාඩි 15 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 15% |
| iii. | ඊළග විනාඩි 30 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 20% |
| iv. | ඊළග විනාඩි 30 තුළ සිදුවන ප්‍රමාදවීම් | -දෛනික ගාස්තුවෙන් 25% |
| v. | ඉන්පසුව වන ප්‍රමාදවීම් සඳහා | -දෛනික ගාස්තුවෙන් 40% |

මීට අමතරව නියම කරන ලද වේලාවට වාහනය එවීමට සැපයුම්කරු දිගින් දිගටම අසමත් වන්නේ නම්. ඉහත දක්වන ලද ප්‍රමාද ගාස්තු නොතකා හරිමින් සේවා කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලයද නාරා ආයතනය සතු වේ. එම බලය නිර්වචනය කිරීමේ පරම අයිතිය නාරා ආයතනය සතුවේ. එහිදී කාර්යසාධන බැදුම්කරයද නාරා ආයතනය සන්තක වේ.

ඉහත දක්වන ලද ඕනෑම ගාස්තුවක් බැදුම්කරය මගින් හෝ මාසික ගාස්තුව මගින් හෝ අයකර ගැනීමේ බලය නාරා ආයතනය සතුය. මෙහිදී එන පළමු වැනි ගෙවීම මත මෙම අයකිරීම සිදු කරනු ලබයි.

කෙසේ වෙතත් පවතින වාතාවරණය යටතේ ප්‍රවාහන සේවා සපයන පාර්ශවයේ පරිපාලනයෙන් තොර පරිබාහිර කාරණයක් හේතුකොට ගෙන හදිසියේ යම් ප්‍රමාදයක් සිදු වූ විට එය පිළිබඳව සලකා බැලීම සඳහා නාරා ආයතන කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා භාර නිළධාරි ට ලිඛිතව ඉල්ලීමක් සිදු කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බලනු ඇත.

---

දැඩි වර්ෂාව නිසා වන මාර්ග තදබදය (ගංවතුර ඇති වූ අවස්ථාවක හැර) සාමාන්‍ය වාහන තදබදය වැනි කරුණු හේතු කොට ගෙන ප්‍රමාද වීම් සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

පාලම්, පාරවල් ,උමං මාර්ගවැනි ඉදිකිරීම් හේතු මත සැලකිය යුතු දින ගණනක් ප්‍රමාද වීම් සිදු විය හැකි බවට පූර්ව නිගමනයක් කළ හැකි අවස්ථා වලදී සිදුවිය හැකි ප්‍රමාදවීම් අවම කර ගැනීම සඳහා විකල්ප මාර්ග භාවිතා කිරීම හෝ ආරම්භක වේලාව වෙනස් කිරීම හෝ වැනි උපක්‍රමික වෙනස් කිරීමක් කිරීමට නාරා ආයතනයේ කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා භාර නිළධාරි ට බලය පවරා තිබේ.

**10. සැපයුම්කරුගේ සේවා ලබා නොදීම:-**

පූර්ව දැනුම් දීමක් නොමැතිව හෝ කල්තබා විකල්ප සැළසීමකින් තොරව නියමිත දිනෙක සේවා සැපයීමට අපොහොසත් වන අවස්ථාවන්හි දී පහත අන්දමට දඩ මුදලක් නොවන හානිපූරණ වන්දියක් අයකරනු ඇත.

i. එක් ගමන් වාරයක් සඳහා :-

මාසික ගාස්තුවෙන් විස්සෙන් එකක(1/20)මුදල හා ඊට 10% දඩ මුදලක් නොවන හානිපූරණ වන්දියක් නාරා ආයතනය විසින් විකල්පයක් සළසා ගැනීම සඳහා වැය කළ මුදල හා ඊට 10% දඩ මුදලක් නොවන හානිපූරණ වන්දියක් හෝ යන දෙකෙහි වැඩි මුදල අය කරනු ඇත.

ii. ඉහත දක්වන ඕනෑම ගාස්තුවක් බැදුම්කරය මගින් හෝ මාසික ගාස්තුව මගින් හෝ අයකර ගැනීමේ බලය නාරා ආයතනය සතුය .මෙහිදී පළමු වැනි ගෙවීම මත මෙම අයකිරීම් සිදු කරනු ලබයි.

11. වාහනය කුලියට ගැනීම් කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි:-

i. **වර්තමානයේ ගෝලීය වසංගතයක් බවට පත්ව ඇති කොරෝනා ව්‍යවසන තත්වය මත ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රවාහන රථය දිනකට දෙවතාව බැගින් විෂබීජ හරණයට ලක් කිරීම අනිවාර්යෙන් සිදු කළ යුතුවේ.**

ii. වාහනය මනා ධාවනය තත්වයකින් යුක්ත විය යුතුය. සෑම වාහනයක්ම ක්‍රියාත්මක තත්වයේ පවතින AM/FM චැනල් සහිත ගුවන් විදුලි යන්ත්‍රයන් තිබිය යුතුය.

iii. සැපයීමට බලාපොරොත්තු වන වාහන කාණ්ඩය සඳහා ලංසු ආරාධනා නිවේදනයේ සඳහන් අන්දමට නියමිත ආසන සංඛ්‍යාවක් තිබිය යුතුය

iv. ලංසු විවෘත කරන දිනට නිෂ්පාදිත වර්ෂයෙන් අවුරුදු 05ක් නොඉක්මවන වාහන සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. ඉදිරිපත් කරන වාහනය හොඳ ධාවන තත්වයේ තිබිය යුතුය.

V. වාහන පරීක්ෂා කරන දිනට රථයේ යෙදවීමට අපේක්ෂිත රියදුරුගේ හා කොන්දොස්තරවරයාගේ වලංගු බලපත්‍ර, රථයේ යෝග්‍යතා සහතික , වාහනයේ ලියාපදිංචි සහතිකය ,පිටාර වායු විමෝචන වාර්තාව, අදායම් බලපත්‍රය, රක්ෂණ සහතිකය යන ඒවායේ මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය. එසේ නොවන්නේ නම් ද, ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

Vi. ලංසු විවෘත කරන දිනට වලංගු ආදායම් බලපත්‍රයේ හා රක්ෂණය සහතිකයේ සහතික කළ ඡායා පිටපත් ලංසු ආකෘති පත්‍රය සමග අමුණා එවිය යුතුය. එසේ නොවවනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vii. සාර්ථක ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර පූර්ණ රක්ෂණයක්ද, කුලී වාහනයක් වශයෙන් යෙදවීම සඳහා රක්ෂණයද, රක්ෂණයෙන් ආවරණය විය යුතුය. වාහනයෙ හි පූර්ණ අයිතිය ලංසුකරු වෙත නොමැති නම් කොන්ත්‍රාත් කාලය ආවරණය වන පරිදි අදාල වාහනය කුලියට දීම සඳහා ලංසුකරුට පූරණ බලය පවරන වලංගු ලිපියක් **ලංසු ආකෘතිය සමග ඉදිරිපත් කළ යුතුය.**

viii. වාහනයේ රියදුරුට මගී වාහන පැදවීම සඳහා නීත්‍යානුකූලව අවසර ලැබී ඇති රිය පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතුය. වාහන භාවිත කරන නිලධාරියා රියදුරාගේ රිය පැදවීම, නියමිත වේලාවට රාජකාරියට වාර්තා කිරීම , ආචාරශීලීත්වය , විනය , හැසිරීම. , අධිවේගී හා නොසැලකිලිමත් ධාවනය. , වාහනයේ පිරිසිදු කම, ආදිය පිළිබඳ සැලකිලිමත් වන අතර., මෙම දුර්වලතාවයන් අතරින් එකක් පිළිබඳව හෝ පළමු වතාවට රියදුරුට අවවාද කිරීමෙන් අනතුරුව තවදුරටත් එම රියදුරු ඉහත කී කරුණු පිළිබඳව නොසැලකිලිමත් වේ නම් ., ලංසුකරුගේ බැදුම්කරය නාරා ආයතනයට පවරා ගැනීමට යටත්ව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලය නාරා ආයතනය සතු වේ.

මේ අනුව රියදුරු වාහනය ධාවනයට නොසුදුසු යැයි වාහනය පාවිච්චි කරන නිලධාරින්ට හැගේ නම් ඔවුන් විසින් කළමණාකරණය වෙත සිදු කරන ලිඛිත දැන්වීම මත වාහන භාර නිලධාරි විසින් සිදු කරන දැනුම්දීමකදී වහාම වෙනත් සුදුසු රියදුරෙකු යෙදවීම කොන්ත්‍රාත්කරුගේ බැදීමකි. එසේම වාහනයේ අලුත්වැඩියා පිළිබඳව දැනුම් දී එම අවශ්‍යතාවය දින 03 ක් තුළ ඉටු කිරීමද කොන්ත්‍රාත්කරුගේ බැදීමකි. වෙනත් රියදුරෙකු යොදවන අවස්ථාවකදී නව රියදුරාගේ රිය පැදවීමේ බලපත්‍රය වාහනය භාවිතා කරන නිලධාරින් ගේ අධීක්ෂණය සඳහා අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කල යුතුය.

ix. ඉන්ධන වියදම්, නඩත්තු. වාරික සේවා. අලුත්වැඩියා සේවා , රියදුරාගේ හා කොන්දොස්තරවරයාගේ වේතනය , ගමන් වියදම් , ඉඩුම් හිටුම්, රක්ෂණ බලපත්‍ර ගාස්තු. ආදි ඕනෑම වියදමක් සැපයුම්කරු විසින් දැරිය යුතුයි.

x. වාහනය අනතුරට ලක් වීම හෝ වෙනත් ආපදාවකදී හෝ වන හානි සඳහා අලාභය හානිපූර්ණය සඳහා හෝ වෙනයම් ගෙවීමක් සඳහා හෝ නාරා ආයතනය බැදී නොමැත.

xi. වාහනය අනතුරට ලක් වීම නිසා හෝ වෙනත් ආපදාවක් නිසා හෝ නැතහොත් වෙනත් හේතුවක් නිසා හෝ රාජකාරියට යෙදවීමට නොහැකිනම්, ඒ බව අවම වශයෙන් වැඩ කරන දින 02 කට කලින් නාරා කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා භාර නිලධාරියාට ලිඛිතව දන්වා, එම තත්වයේම වෙනත් වාහනයක් කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය. එසේ නොවෙන අවස්ථා වලදී කාර්යසාධන බැඳුම්කරය නිදහස් නොකිරීමේ කටයුතු යෙදීමේ බලය නාරා ආයතනය සතුය. එම රථය ආයතනයේ පරීක්ෂාවට භාජනය කර අනුමැතිය ලබා ගත යුතුය..

xii. වාහනයේ කොන්ත්‍රාත් කාල සීමාව කල් පිරීමට පෙර අවසන් කිරීමට හෝ තවත් දීර්ඝ කිරීමට නාරා ආයතනය තීරණය කළහොත් .ඒ පිළිබඳ දින 14 ක පූර්ව දැනුම් දීමක් කරනු ඇත.

xiii. සාර්ථක ලංසුකරු නාරා ආයතනය සමග මෙම සේවා සැපයීම සම්බන්ධව ඉහත සඳහන් කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹිය යුතුය.

xiv. මෙම සේවා කොන්ත්‍රාත්තුව වෙනත් අයකුට පැවරීමට හෝ උපකොන්ත්‍රාත් ලබා දීම හෝ සිදුකල නොහැක

XV..ප්‍රවාහන සේවා වාහන ගාල් කිරීමේ පහසුකම් නාරා ආයතනය විසින් සපයනු නොලැබේ.

**ලංසු ඇගයීමේ පටිපාටිය**

ලංසු ඇගයීමේදී පහත සඳහන් කරුණුද සැලකිල්ලට ගනු ඇත.

i. දෛනිකව අදාල ගමන් මාර්ගයේම ගමන් කරමින් නාරා කාර්ය මණ්ඩලය ප්‍රවාහන කිරීම සඳහා වැය කළ යුතු ඩීසල් ලීටර් ගණන.

ii. ඉහත 1 හි සඳහන් ඉන්ධන පමාණයට වැය වන මුදල් හැර දෛනික ගාස්තුව.

iii. වාහනයේ තත්වය හා බලපත්‍ර (වාහනයේ භෞතික තත්වය,අදාළ බලපත්‍ර හා සහතික වාහනය පරීක්ෂා කරන අවස්ථාවේදී පරීක්ෂා කරනු ලැබේ.ඇගයීම් ආකෘතිය අමුණා ඇත)

iv. සැපයුම්කරුගේ පළපුරුද්ද.(සේවා සහතික ලංසුව සමග අමුණා එවිය යුතුය)

**වැදගත්-දෛනික ගාස්තුව පිළිබඳව සළකා බලන්නේ ජාතික ප්‍රවාහන කොමිසමේ නිර්දේශයන්ට යටත්වය.**

යොමුව- නාරා/පාලන/2021/116/RL/ටෙන්ඩර් අංක46

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

## කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා මාසික කුලී පදනම මත වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කිරීම.

| ලංසු ඉදිරිපත් කිරීමේ ලේඛණය | | | |
|---|---|---|---|
| 01 | ලංසුකරුගේ සම්පූර්ණ නම | | |
| 02 | ලංසුකරුගේ ලිපිනය | | |
| 03 | ලංසුකරුගේ දුරකථන හා ෆැක්ස් අංක | | |
| 04 | ලංසුව ඉදිරිපත් කරන මාර්ගය | | |
| 05 | ඉදිරිපත් කරන වාහනයේ අංකය/අංක හා ලියාපදිංචි වර්ෂය (විස්තර ලියා අමුණන්න) | වාහන අංකය | ලි.ප වර්ෂය |
| | | | |
| 06 | ඉදිරිපත් කරන වාහනයේ වර්ගය හා නිෂ්පාදිත වර්ෂය (ලියාපදිංචි සහතිකවල පිටපත් අමුණන්න) | වාහනයේ වර්ගය | නිෂ්පාදිත වර්ෂය |
| | | | |
| 07 | ඉදිරිපත් කරන වාහනයේ අයිතිකරු ලංසුකරු නොවේ නම් ,අයිතිකරුගේ නම හා ලිපිනය | නම | ලිපිනය |
| | | | |
| 08 | ඉදිරිපත් කරන වාහනයේ ආපදාවකදී සැපයීමට අමතර වාහන තිබේද | | |
| 09 | එම වාහනයේ/වාහන වල අංක | | |
| 10 | වැට් සඳහා ලියාපදිංචි වී තිබේනම් එහි අංකය | | |
| 11 | ඉදිරිපත් කරන වාහනයේ ඩීසල් ලීටරයකින් ධාවනය කළ හැකි කිලෝමීටර ගණන (විස්තර ලියා අමුණන්න) | | |
| 12 | වාහනයට සම්බන්ධ පහසුකම් හා උපාංග පිළිබඳ විස්තර(FM/AM චැනල් සහිත ගුවන් විදුලි යන්ත්‍රයක් පැවතීම්,වායු සමීකරණ,ස්වංක්‍රිය දොර,සීඩී ප්ලේයර්,රූපවාහිනී යන්ත්‍ර ආදීය) | | |

| | | |
|---|---|---|
| 13. | ලංසු ඉදිරිපත් කරන ප්‍රවාහන සේවාවට අදාළව ගමන් මාර්ගයේ කළුතර බස් නැවතුම්පොළ සිට නාරා ආයතනයටත් ආපසු එම මාර්ගයේම කළුතර බස් නැවතුම්පළ දක්වා ගමන් කරමින් නාරා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරිම සදහා එක් දිනකට වැය කළ යුතු ඩීසල් ලීටර ගණන: | |
| 13.1 | ඩීසල් වියදම හා වැට් හැර දෛනික ගාස්තුව | |
| 13.2 | වැට් (VAT)ගෙවන්නේ නම් එම මුදල | |
| 13.3 | ඩීසල් වියදම හා වැට් හැර වැඩ කරන දින 20 ක මාසයක් සඳහා මාසික ගාස්තුව | |
| 14 | කළුතර බස් නැවතුම්පොළ සිට අළුත්ගම බස් නැවතුම්පොළ දක්වා ගමන් කිරිමට (කි.මී 18.1)හා ආපසු එම මාර්ගයේම කළුතර බස් නැවතුම්පොළ තෙක් ගමන් කිරිම (කි.මී 18.1) සදහා එක් දිනකට වැය කළ යුතු ඩීසල් ලීටර ගණන: | |
| 14.1 | ඩීසල් වියදම හා වැට් හැර දෛනික ගාස්තුව | |
| 14.2 | වැට් (VAT)ගෙවන්නේ නම් එම මුදල | |
| 14.3 | කළුතර බස් නැවතුම්පොළ සිට අළුත්ගම බස් නැවතුම්පොළට යාමට හා ඒමට ඩීසල් වියදම හා වැට් හැර වැඩ කරන දින 20 ක මාසයක් සඳහා මාසික ගාස්තුව | |

අදාළ ප්‍රවාහන සේවය සඳහා මා විසින් ඉදිරිපත් කරන ලංසුව නාරා ආයතනය විසින් පිළිගතහොත් ලංසු කැදවීම් නිවේදනයේ පරිදි කාර්යසාධන බැදුම්කරය තැන්පත් කිරිමට එකග වෙමි.ලංසුවේ වලංගු කාලය 2021..............දක්වා වේ.

ඉහතින් මා සදහන් කළ සියළුම විස්තර නිවැරදි බවටත් ,මා මෙම ලංසු කැදවීමේ නිවේදනයේ සදහන් කොන්දේසිවලට එකග වන බවත් ,මගේ වාහන මෙම ලංසු ආකෘතියේ සදහන් මිළට යටත්ව කුළියට ලබා දීමට එකග වන බවත් මෙයින් සහතික කරමි.

.......................................................          .............................................

ලංසුකරුගේ අත්සන          මුද්‍රාව

.......................................................

දිනය